Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# තංගල්ල ප්‍රාදේශීය සභාව

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

තංගල්ල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ට සහ තංගල්ල ප්‍රාදේශීය සභාවේ දැනටමත් තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුක්ත වූ අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.)

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේතය/ වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | රියදුරු | 02 | PL3-03/2016 | 1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් විය යුතු ය.<br>2. මගී ආසන 26ට වැඩි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලබා තිබිය යුතු ය. ('ඒ' පන්තියේ බලපත්‍රයක් ) අවම වශයෙන් වාහන රියදුරෙකු ලෙස වසර 03ක පළපුරුද්දක් ලබා තිබිය යුතු ය. |
| 02. | සෞඛ්‍ය කම්කරු | 02 | PL1-03/2016 | අටවන ශ්‍රේණිය (නවවන වසර) සමත් විය යුතු ය. |
| 03. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | PL1-03/2016 | අටවන ශ්‍රේණිය (නවවන වසර) සමත් විය යුතු ය. |
| 04. | පුස්තකාල සහායක | 01 | PL1-03/2016 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් විය යුතු ය. |

03. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 5කට වැඩි කාලයක් අයදුම්කරු දකුණු පළාත තුළ පදිංචිකරුවෙකු විය යුතු ය.
3. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතු ය.
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවකු කරනු ලැබූවකු හෝ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.
5. සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

04. *වයස් සීමාව -*

ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට වයස් සීමාව බල නොපැවැත් වේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි -*

01. තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතයි. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.

02. පත් වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

03. වාර්ෂික වැටුප් පරිමාණය :

රියදුරු : රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990
සෞඛ්‍ය කම්කරු වැඩ/ක්ෂේත්‍ර කම්කරු පුස්තකාල සහායක රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00

04. පළමු කාර්යක්ෂමතා කඩඉම, බඳවාගනු ලැබීමෙන් පසුව එළඹෙන පළමු වසර තුන ඉක්මවා යාමට පෙර සමත් විය යුතු ය.

- රියදුරු - මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුම මැනීම පරීක්ෂණයකින් සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතු ය.
- සෞඛ්‍ය කම්කරු, වැඩ/ක්ෂේත්‍ර කම්කරු, පුස්තකාල සහායක - සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම රාජකාරිවලට අදාළ දැනුම හා තනතුරට පැවරෙන කාර්යයන් පිළිබඳව දැනුම හා අත්පත් කර ගත යුතු ප්‍රවීණතාවයන් පිළිබඳ පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

05. එම තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිවල නියෝගවලට අමතරව, ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට සහ දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

06. *අයදුම්කළ යුතු පිළිවෙල:*

1. මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘති ප්‍රකාරව A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "සභාපති, තංගල්ල ප්‍රාදේශීය සභාව, නෙටොල්පිටිය" යන ලිපිනයට 2018.12.28 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
2. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "…………………………. තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර තිබිය යුතු ය.
3. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු යි.
4. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් පිළිබඳව සළකා බලනු නොලැබේ.
5. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල සහතික කළ පිටපත් එවිය යුතු යි. සහතිකවල මුල් පිටපත් පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතිකය;
(iii) පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය;
(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්;
(v) වෘත්තීය සුදුසුකම් සහතිකය;
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය.

ලාලිත ආර්. වනිගසේකර,
සභාපති,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
නෙටොල්පිටිය,
තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***තංගල්ල ප්‍රාදේශීය සභාව***

***.................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————————————
02. මුලකුරු සමග නම :————————————.
03. ස්ථිර ලිපිනය :————————————.
04. උපන් දිනය : අවුරුද්ද:—————, මාසය :—————, දිනය:—————,
05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :—————, මාස :—————, දින:—————,
06. ස්ත්‍රී/පුරුෂ භාවය:———————————— .
07. විවාහක/අවිවාහක බව :————————————.
08. ජාතිය/ආගම :———————————— .
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග : ______ .
10. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :———————————— .
11. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් අමුණා එවන්න) :———————————— .
12. වෙනත් සුදුසුකම් :———————————— .
13. සේවා පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :———————————— .
14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්, එම සේවා කාලය සහ විස්තර, එම පත්වීමේ ස්වභාවය (තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) :———————————— .
15. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලබා උසාවියකින් වරදකරු වී තිබේද ? :———————————— .

අනාවරණය වුවහොත්, නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දන්වමි.

————————;
අයදුම්කරුගේ අත්සන

දිනය :————— .

---

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**
**(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)**

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවත්, .......................................................... වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

දිනය:————— .

________________ ;
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.